**19-03-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, බාප් හා දාදා දෙදෙනාම නිරහංකාරීව හා ජීව අවධානයේ සිටිනවා සේම, එලෙසම ඔබත් පියා අනුගමනය කළ යුතු අතර දිගටම ඔබව නිරන්තරව වර්ධනය කරගත යුතුය.

**ප්‍රශ්නය:** උසස් තත්වයක් ලබා ගැනීම සඳහා ඔබ ප්‍රවේසම් විය යුක්තේ කුමක් සම්බන්ධයෙන්ද?

**පිළිතුර:** උසස් තත්වයක් හිමිකර ගැනිමේ අවශ්‍යතාවය තිබෙනවානම් මේ කෙරෙහි අවධානය යොමු කරන්න 1. ඔබගේ මනසින්වත් කිසිම කෙනෙකුට දුක් නොදීම. 2. කිසිම සිදුවීමකදි කෝපයට පත් නොවීම. 3. පියාට අයත් වීමෙන් පසුව පියාගේ කාර්යයටවත්, රුද්‍රාගේ මෙම යාගයටවත් බාධා කරන්නෙකු බවට පත් නොවීම. 'බාබා, බාබා,' යනුවෙන් සැමවිටම කියමින් නමුත් හැසිරීමෙන් රාජකිය නොවන අයට උසස් තත්ත්වයක් ලබා ගත නොහැකිය.

ඕම් ශාන්ති. තමන් අනිවාර්යෙන්ම තම පියාගෙන් උරුමය දිනා ගත යුතු බව දරුවන් වන ඔබ තේරුම් ගෙන තිබෙනවා. කොහොමද? ශ්‍රීමත් අනුගමනය කිරීමෙන්. පරමාත්ම දෙවියන් විසින් පවසන ලද උසස් වදන් ඇතුලත්වන එකම ග්‍රන්ථය ගීතාව පමණක්ය යන්න පියා පැහැදිලි කර කියා දී තිබෙනවා. දෙවියන් සියලු දෙනාගේම පියාය. උසස් වදන් පවසන්නේ පරමාත්ම දෙවියන්ය. දෙවියන් අනිවාර්යෙන්ම පැමිණ ඇති අතර ජීවයන් උසස් කරවා ඇත. ඔහු ගෞරවයට පාත්‍රව ඇත්තේ ඒ නිසාය. 'ශ්‍රීමත් භගවත් ගීතාව' යනු දෙවියන් විසින් පැවසූ උසස් වදන්ය. පරමාත්ම දෙවියන් අනිවාර්යෙන්ම උසස්ම උසස් කෙනායි. උසස් වදන් ඇති එකම ග්‍රන්ථය එය පමණයි. දෙවියන් විසින් පවසන ලද උසස් වදන් වෙනත් කිසිම ග්‍රන්ථයක නැත. ලියූ කෙනාවත් ඒවා කවුරුන් විසින් කියන ලද්දේදැයි නොදනී. ඒ වැරැද්ද කර තිබෙන්නේ ඇයි? පියා පැමිණ ඒ සියල්ල පැහැදිලි කර කියා දෙනවා. රාවන්ගේ රාජ්‍යය ආරම්භ වූ මොහොතේ සිටම, ඔවුන් රාවන්ගේ උපදෙස් අනුගමනය කරන්නට පටන් ගත්තා. පළවෙනි දරුණුතම වැරැද්ද කළේ රාවන්ගේ උපදෙස් අනුගමනය කළ අයයි. ඔවුන් රාවන්ගෙන් පහර කෑවා. බෝම්බ ආදිය සෑදීමට ශන්කර් අන් අයව උනන්දු කෙරෙව්වාක් මෙන් පංච මහා පාප නම් වූ රාවණ් අපිරිසිදුතාවයට පත් වීමට මිනිසුන් උනන්දු කෙරෙව්වා. අහෝ පාරිශුද්ධකරුවාණනි පැමිණෙන්න! කියා ඔවුන් කෑ ගැසුවේ අන්න ඒ නිසයි. එසේ නම් පාරිශුද්ධකරු වන්නේ එකම කෙනායි. ඔබව අපිරිසිදුතාවයට පත් කරවන්නා සහ පාරිශුද්ධතාවයට පත්කරවන්නා එකිනෙකට වෙනස් දෙදෙනෙක් බව මින් ඔප්පු වෙනවා. දෙදෙනෙක්ට එක හා සමාන විය නොහැකියි. ඔබ දරණා උත්සාහයේ හැටියට තේරුම් ගන්නේ ඔබ පමණයි. සියලු දෙනාටම ශ්‍රද්ධා විශ්වාසය ඇතැයි සිතන්න එපා එය අංක පිළිවෙලටයි. විශ්වාසය වැඩි වුණු තරමට සතුට වැඩිවෙනවා. ඔබ පියාගේ උපදෙස් අනුගමනය කළ යුතුයි. ස්වාධිපත්‍යය දිනා ගැනීම සඳහා අපි ශ්‍රීමත් අනුගමනය කළ යුතුයි. සාමාන්‍ය මනුෂ්‍ය තත්ත්වයේ සිට දේවතාවන් බවට පත්වීමට එතරම් කාලයක් ගත වූයේ නැහැ. ඔබ උත්සාහ දරණවා. මමා සහ බාබා අනුගමනය කරනවා. ඔවුන් අන් අයවත් තමා හා සම තත්ත්වයට පත් කර ගැනීම සඳහා සේවය කරනවා. එමනිසා, ඔවුන් කරන සේවය හා සසඳන කල තමා අතින් කෙරෙන්නේ කුමන ආකාරයේ සේවයද යන්න ඔබට තේරුම් ගත හැකියි. ශිව බාබාත් බ්‍රහ්ම බාබාත් එකට සිටිනා බව බාබා කියා දී තිබෙනවා. එමනිසා, වඩාත් සමීපයෙන්ම සිටින්නේ ඔහු යන්න බව අවබෝධ කර ගත යුතුයි. සූක්ෂම ලෝකයේ පෙනෙන්නට තියෙන්නේ ඔහුගේ (බ්‍රහ්මාගේ) පරිපූර්ණ තත්ත්වයයි. එමනිසා, ඔහු අනිවාර්යෙන්ම සියලු දෙනාටම ඉදිරියෙන් සිටින්නා විය යුතුයි. කොහොමනමුත්, පියා ඉතා නිරහංකාරී හා ජීව අවධානයෙන් යුක්ත වූවා සේම මේ දාදාත් ඉතා නිරහංකාරියි. ඔහු කියනවා ශිව බාබා දිගින් දිගටම ඔබට පැහැදිලි කර කියා දෙනවා. මුරලිය දෙන වේලාවේදි මේ බාබා කියනවා මොහු හරහා කතා කරන්නේ ශිව බාබා බව තේරුම් ගන්න. මේ බ්‍රහ්මාත් අනිවාර්යෙන්ම ඇහුම් කන් දෙනවා විය හැකියි. ඔහු එයට ඇහුම් කන් දුන්නේ නැත්නම්, තවත් කෙනෙකුට කියා දුන්නේ නැත්නම් උසස් තත්ත්වයක් ලබාගන්නේ කෙසේද? කොහොමනමුත්, ඔහු ඔහුගේ ශරීර අවධානයෙන් ඉවත් වී මෙසේ කියනවා සැම දෙයක්ම ඔබට කියන්නේ ශිව බාබා බව තේරුම් ගන්න. මා නොකඩවාම උත්සාහ කරනවා. මේ සැම දෙයක්ම විස්තර කරන්නේ ශිව බාබා පමණයි. අපිරිසිදු බවට පත්වීමේ තත්ත්වය මොහු අත් දැක තිබෙනවා. මමා කුමාරි කෙනෙක් වූ හෙයින් ඇය ඉදිරියටම ගියා. කුමාරින් වන ඔබත් මමාව අනුගමනය කළ යුතුයි. ඔබ අපිරිසිදු බවත් පාරිශුද්ධත්වයට පත්විය යුතුම වන බවත් ඔබ සැම කෙනෙක්ම තේරුම් ගත යුතුයි. පියා ඔබට උගන්වන ප්‍රධාන දෙය තමයි ස්මරණ වන්දනාව. මෙහිදි

කිසිමාකාරයක ශරීර අවධානයක් නොතිබිය යුතුයි. හොඳයි ඔබ කවුරු හෝ දැනුම දෙන්න දන්නේ නැත්නම් ස්මරණය නැමැති වන්දනා ගමනෙහි යෙදෙන්න. ස්මරණය නැමැති වන්දනා ගමනෙහි යෙදීමෙන් ඔබට දැනුම දීමටත් හැකිවෙනවා. කොහොමනමුත්, ඔබට ස්මරණ වන්දනාවෙහි යෙදීමට අමතක වුවහොත් ඊට කමක් නැහැ. දැනුම දෙන්න, පසුව ස්මරණ වන්දනාවෙහි නිරතවන්න. මන්ද ඒ ශබ්දය අභිබවා යන තත්ත්වය තමයි විශ්‍රාමික තත්ත්වය ලෙස හඳුන්වන්නේ. ප්‍රධානම දෙය වන්නේ තමා ජීවාත්මයක් ලෙස සිතීමත්, නොකඩවාම පරමාත්ම පියා හා චක්‍රය සිහිපත් කිරිමත්ය. කිසිම කෙනෙක්ට දුක දෙන්න එපා. ඉතා සරළ ලෙස පියා සිහිපත් කරන්න. මෙය තමයි වන්දනා ගමන. කෙනෙක් මිය ගිය විට මිනිසුන් කියනවා ඔහු දිව්‍ය ලෝකයට ගියායි කියා. අවිද්‍යා මාර්ගයේ සිටින කිසිම කෙනෙක් දිව්‍ය ලෝකය සිහිකරන්නේ නැහැ. දිව්‍ය ලෝකය සිහි කරනවා යනු මෙම ලෝකයේ සිට මිය යාමක් වැනි දෙයක්. වෙන කිසිම කෙනෙක් එතරම් ලේසියෙන් එය සිහිපත් කරන්නේ නැහැ. දරුවන්ට දැන් තේරෙනවා ඔබ නිවස වෙත යා යුතු බව. පියා කියනවා ඔබ බාබාව සිහිපත් කරන තරමට ඔබගේ සතුට නම් වූ රසදිය කඳ ඉහළ නඟිනවා. ඔබ ඔබගේ උරුමය සිහිපත් කළ යුතුයි. ඔබ කෙතරම් දුරට බාබාව සිහිපත් කරනවාද ඒ තරමට උද්යෝගයෙන්ද සිටිනවා. පියාව සිහි නොකිරිම නිසා ඔබ දිගින් දිගටම පටලැවිලි සහගත තත්ත්වයට පත්වන අතර නොකඩවාම කොතැනක හෝ සිරවන්නට සිදුවෙනවා. එතරම් විශාල කාල පරිච්ඡේදයක් පුරා ඔබට ස්මරණයෙහි යෙදෙන්න බැහැ. බාබා ඔබට ආදරවන්තයා හා ආදරවන්තියගේ උදාහරණය දී තිබෙනවා. පෙම්වතා තම රාජකාරියට ගොස් සිටින අතරේ පෙම්වතිය තම ඇඳුම් මසමින් සිටියත් ඇයට තමා ඉදිරියේ ඔහු ඉන්නවා සේ පෙනෙනවා. පෙම්වතිය පෙම්වතාව සිහිපත් කරනවා. මෙහිදි ඔබ සිහිපත් කළ යුත්තේ ඒ එකම පියා පමණයි. පියාට ඔබව සිහි කිරීමක් අවශ්‍ය වන්නේ නැහැ. පියා සැමගේම පෙම්වතායි. දරුවන් මෙසේ ලියනවා බාබා, ඔබ මාව මතක් කරනවාද? ඔහෝ! සැමගේ පෙම්වතා වන ඔහු පෙම්වතියන් වන ඔබව සිහිපත් කරන්නේ කෙසේද? එය විය නොහැකි දෙයක්. ඔහු තමයි ආදරවන්තයා. ඔබ ඔහුව සිහිපත් කළ යුතුමයි. ඔබ සැම කෙනෙක්ම ඒ එකම එක පෙම්වතාගේ පෙම්වතියන් බවට පත් විය යුතුය. ඔහු පෙම්වතිය වූවානම් ඔහු කී දෙනෙක් මතක්කරාවිද? එය සිදු විය නොහැකි දෙයක්. ඔහු කියනවා අනෙක් අයව සිහි කරන්නට මා තුළ කිසිමාකාරයක පාපවල බරක් නැහැ. ඔබ තුළ තමයි බර තියෙන්නේ. ඔබ පියාව සිහ කළේ නැතහොත් පව් බර ඉවත්ව යන්නේ නැහැ. මම මොකටද වෙන අයව සිහි කරන්නේ? ජීවාත්ම වන ඔබ මාව සිහිපත් කළ යුතුයි. ඔබ ස්මරණයෙහි යෙදෙන තරමටම ඔබ ජීවාත්මය පිරිසිඳු හා පුණ්‍යවත් බවට පත්වන අතර ඒ තරමට ඔබගේ පාප කැපී යයි. ඉලක්කය ඉතාම ඉහළයි. ජීව අවධානයට පත්වීම සඳහා උත්සහායක් අවශ්‍යයි. ඔබ මේ සියලුම දැනුම ලබාගන්නවා. අනුපිළිවෙලින් තමා දරණ උත්සාහයට අනුව ඔබ ත්‍රිකාල්දර්ශී තත්ත්වයට පත්වෙනවා. මේ මුළු චක්‍රයම ඔබගේ බුද්ධිය තුළ තිබිය යුතුයි. පරම පියා විස්තර කරනවා ඔබ පහන් ප්‍රදීපස්ථම්භයන්ය. එහෙම නේද? ඔබ තමයි සැම දෙනෙකුටම සාම දේශය හා සතුටු දේශයට යන මාර්ගය පෙන්වා දෙන්නේ. ඔබ මේ අලුත් කරුණු සියල්ලටම සවන් දෙනවා. ඇත්ත වශයෙන්ම ජීවාත්මය වන ඔබ සිටියේ සාම දේශයේ බව ඔබ දන්නවා. ඔබ මෙහි එන්නේ ඔබගේ කොටස රඟ දැක්වීම සඳහායි. අපි නළුවෝ වෙමු. මේ ආකාරයේ සිතිවිලි දිගින් දිගටම සිතේ තබා ගන්න. එවිට ඔබ කුල්මත්භාවයට පත්වනු ඇත. මුල සිට අග දක්වාම ඔබගේ කොටස කුමක්ද කියා පියා ඔබට විස්තර කර දී තිබෙනවා. ඔබ දැන් අනිවාර්යෙන්ම ඔබගේ කර්මටීට් තත්ත්වයට පත් වී පසුව සත් යුගයට යා යුතුයි. මේ ගැන සැලකිලිමත් වන අතර ඔබට යමක් කරගන්න! නිකම්ම පණ්ඩිතයෙක් බවට පත්වන්න එපා! ඔබ අනෙක් අයට උගන්වමින් සිටින නමුත් ඔබව ඒවා අනුගමනය කරන්නේ නැත්නම් එයින් කිසිම ඵලක් නැහැ. ඔබත් ඔබගේ උත්සාහයෙහි නිරත විය යුතුයි. බාබාත් ඔහු ස්මරණයෙහි යෙදෙන්න උත්සාහ දරන්නේ කෙසේද කියා ඔබට කියනවා. සමහරවිට මායාගේ කුණාටු කෙතරම් දුරට එනවාද කියතොත් එය ඔබගේ බුද්ධියේ යෝගාව පවා බිඳ දමන්නට සමත් වෙනවා. බොහෝ දරුවන් තමන්ගේ වාර්තාව ගෙන එනවා. ඔවුන් මටත් වඩා ඉහළින් යනවා කියා බාබා පුදුම වෙනවා. සමහර විට ඔවුන්ට එම බලය දැනෙනවා, එමනිසා, ඔවුන් තමන්ගේ වාර්තාව ලියන්න පටන් ගන්නවා. කොහොමනමුත්, ඔවුන් මෙම තරඟයෙහි එතරම් වේගයෙන් දිව්වොත් ඔවුන් පළමුවන ස්ථානයම ලබා ගනීවි. නමුත් එසේ වන්නේ නැහැ. එය ඔවුන්ගේ වාර්තාවටම සීමා වූ දෙයක් පමණයි. ඔවුන් තමන් කී දෙනෙක් තමා හා සම තත්ත්වයට පත් කළාද කියා ලියන්නේ නැහැ. අනෙක් අයත් බාබාට මෙසේ ලියන්නේ නැහැ බාබා මොහු මා හට මාර්ගය පෙන්වා දුන්නා. බාබා ලඟට එවැනි වාර්තාවක් එන්නේ නැහැ. ඉතින් බාබා මොනවද තේරුම් ගන්නේ? ඔබගේ වාර්තාව පමණක් යැවීමෙන් කිසිම දෙයක් සිදුවන්නේ නැහැ. ඔබ අනෙක් අයවත් ඔබ වැනිම තත්ත්වයට පත් කළ යුතුයි. එසේ නැතහොත් ඔබ පියා හා සම වන්නේ නැහැ. ඔබ නිවැරදි රූප් බසාන්ට් තත්ත්වයට පත්විය යුතුයි. මේ සඳහා තමයි උත්සාහය අවශ්‍යවන්නේ. ශරීර අවධානය ඔබව මරා දමනවා.

රාවණ් ඔබව ශරීර අවධානයට පත් කර තිබෙනවා. ඔබ දැන් ජීවාත්ම අවධානයට පත්වෙනවා. පසුව චක්‍ර භාගයකින් පසු මායා රාවණ් ඔබව ශරීර අවධානයට පත්කරවනවා. ජීව අවධානයක සිටින අය බොහෝ මිහිරි තත්ත්වයකට පත්වනවා. කිසිම කෙනෙක් තවම සම්පූර්ණ නැහැ. මේ නිසා තමයි බාබා සැම විටම කියන්නේ කිසිම කෙනෙකුගේ සිත රිදවන්න එපා. දුක් දෙන්න එපා. සැම කෙනෙකුටම පියාගේ හැඳින්වීම ලබාදෙන්න. ඔබ කතාකරන විදිය හා පවත්වන සම්බන්ධතාවන් රාජකීය විය යුතුයි. සත්‍යයේ දරුවන්ගේ කටින් සැම විටම පිට විය යුත්තේ මිණිමුතු පමණයි. ඔබ මිනිසුනට ජීවිත දානය දෙනවා. ඔවුන්ට මාර්ගය පෙන්වා මෙසේ කියන්න ඔබ පරමාත්ම දෙවියන්ගේ (සත්‍යයේ) දරුවන්. එහෙම නේද? ඔබ ඔහුගෙන් සත් යුගයේ රාජ්‍යය ලබා ගත යුතුයි. ඉතින්, මේ කාලයේදී ඔබ එය ලබාගන්නේ නැත්තේ ඇයි? මෙය පමණක් සිහිපත් කරන්න ඇත්තෙන්ම ඔබ පියාගෙන් ඔබගේ උරුමය ලබා ගත්තා. එහෙම නේද? භාරතයේ මිනිසුන් වන ඔබ දේවතාවන් වූවා ඔබ උපත් 84 ක් ලබාගත්තා. ඔබ ලක්ෂ්මී හා නාරායනගේ වංශයට අයත් වූවා යන්න වටහා ගන්න. ඔබ වෙන කවුරුවත් වුණා කියා සිතන්නේ ඇයි? සැම කෙනෙකුටම එම තත්ත්වයට පත් වන්නට බැහැයි කියා කියන අය මෙම වංශයට අයත් නොවන බව බාබා තේරුම් ගන්නවා. ඔවුන් දැන් චංචල වීමට පටන්ගෙන තිබෙනවා. ඔබ උපත් 84 ක් ලබාගෙන තිබෙනවා. බාබා ඔබට උපත් 21 ක් සඳහා වූ තිළිණයක් ලබා දුන්නා. ඔබ එය භාවිත කිරීමට පටන්ගෙන පසුව විනාශ කළා. ඔබ මළකඩ තැවරි සිටි අතර දැන් බෙලි කටුවක් වත් නොවටිනා ලෙස තමෝප්‍රධාන් තත්ත්වයට පත්ව සිටිනවා. භාරතයේ තමයි 100% ණයගැතිභාවයෙන් සිටියේ. ඔවුන් ඔවුන්ගේ උරුමය ලබාගත්තේ කොහෙන්ද? මෙය කිව හැක්කේ නළුවන්ට පමණයි. මනුෂ්‍යයන් තමයි ඒ නළුවන්. ලක්ෂ්මී සහ නාරායන එම රාජ්‍යය ලබාගත්තේ කොහෙන්ද යන්න ඔවුන් වටහා ගත යුතුයි. මේවා ඉතාමත් හොඳ කරුණුයි. ඔවුන් අනිවාර්යෙන්ම ඔවුන්ගේ මීට පෙර උපතේදීත් රාජ්‍යය නම් වූ වාසනාව ලැබුවා විය හැකියි. පාරිශුද්ධකරු වන්නේ පරමාත්ම පියා පමණයි. ඔහු කියනවා මා ඔබට, ක්‍රියා, සාමාන්‍ය ක්‍රියා හා පාප ක්‍රියා පිළිබඳ වූ න්‍යාය කියාදෙනවා. රාවන්ගේ රාජ්‍යයේදි මනුෂ්‍යයන්ගේ ක්‍රියා පාපකාරි වෙනවා. එහිදි ඔබගේ ක්‍රියා සාමාන්‍යයි. මේ තමයි දිව්‍යමය ලෝකය. මා තමයි නිර්මාණකරුවා. ඉතින් මා සංගම් යුගයට පැමිණිය යුතුමයි. මෙය රාවන්ගේ රාජ්‍යයයි. එය දෙවියන්ගේ ලෝකයයි. පරමාත්ම දෙවියන් දැන් ස්ථාපිත කිරිම සිදුකරනවා. දැන් ඔබ සැම කෙනෙක්ම දෙවියන්ගේ දරුවන්. ඔබ ඔබගේ උරුමය ලබනවා. භාරතයේ මිනිසුන් කිසිම ණයකින් තොරව සිටි අතර දැන් ණයබරිත තත්ත්වයට පත්ව සිටිනවා. මෙම නාටකය ඒ ආකාරයෙන්ම සැකසී තිබුණු එකක්. කිසිම වෙනසක් සිදු විය නොහැකියි. මෙම වෘක්ෂයේ සැම කෙනෙක්ම තමන්ගේ කොටසට අයිති වී සිටිනවා. මෙය විවිධ ආකාරයෙන් යුතු වූ ගසක්. දේව ධර්මයට අයත්ව සිටි අය නැවතත් දේව ධර්මයට යනවා. ක්‍රිස්තියානි ආගමට අයත් වන අය ඔවුන්ගේ ධර්මය ගැන සතුටු වෙනවා. ඒ වගේම ඔවුන් අනෙක් අයවත් තම ආගමට බඳවා ගන්නවා. භාරතයේ මිනිසුන් තමන්ගේම ධර්මය අමතක කර දමා තිබෙන නිසා ඔවුන් අනෙක් ආගම් ඊට වඩා හොඳයි කියා සිතනවා. බොහෝ මිනිසුන් හොඳ පඩියක් ලබා ගත හැකි නිසා විදේශයන් බලා යනවා. මෙම නාටකය ඉතාමත් අසිරිමත් ලෙස හැඩ ගැසී තිබෙනවා. එය තේරුම් ගැනීම සඳහා ඉතාමත් හොඳ බුද්ධියක් තිබිය යුතුයි. දැනුම් සාගරය නැවත නැවත ආවර්ජනය කිරිමෙන් ඔබට සියලු දේ තේරුම් ගත හැකි වෙනවා. මෙම නාටකය සදාකාලිකවම ඒ ආකාරයෙන්ම සිදුවෙනවා. දරුවන් වන ඔබ මෙන්ම අන් අයවත් නිරන්තරයෙන් සතුටට පත් කළ යුතුය. අපවිත්‍රතාවය පවිත්‍ර කිරීම ඔබගේ කාර්යයයි. පියාගේ කාර්යය කුමක්ද? ඔබගේ කාර්යය වන්නේ ද එයමයි. ඔබගේ මුහුණ දේවතාවුන්ගේ මෙන් නිරන්තරයෙන්ම උද්යෝගිමත විය යුතුයි. තමන් ලෝක පාලකයන් බවට පත්වීමට යන බව ඔබ දන්නවා. එමනිසා, ඔබ දරුවන් ආදරණීය දරුවන් වේ. කෝපය පිළිබඳව ඔබ බොහෝ සැළකිලමත් විය යුතුය. පරම පියා පැමිණ සිටින්නේ දරුවන්ට ඔවුන්ගේ සතුට නම් වූ උරුමය ලබාදීම සඳහායි. සැම කෙනෙකුටම දිව්‍ය ලෝකය කරා වූ මාර්ගය පෙන්වා දෙන්න. පියා තමයි දුක ඉවත්කරන්නා හා සතුට පිරිනමන්නා වන්නේ. ඔබත් සතුට දානය කරන්නන් බවට පත්විය යුතුය. කිසිම කෙනෙකුට දුකක් දෙන්න එපා. ඔබ කවුරු හෝ කෙනෙකුට දුකක් දුන්නොත් ඒ සඳහා දඬුවම සිය ගණනකින් වැඩිවෙනවා. කිසිම කෙනෙකුට දඬුවම් වලින් බේරි සිටිය නොහැකියි. දරුවන්ට විශේෂ අධිකරණයක් තිබෙනවා. පරම පියා කියනවා ඔබ බාධා ගෙන ආවහොත් බොහෝ සෙයින් දඬුවම් ලැබීමට සිදුවෙනවා. සැම චක්‍රයකදීම අහවල් අහවල් තැනැත්තා පත්වන්නේ කුමන තත්ත්වයකටද යන්න ගැන ඔබ දර්ශන දකිනවා. මුල් දිනවලදී දරුවන්ට මේවා පෙන්වූවා. නමුත් බාබා ඒවා අනෙක් අයට පැවසීම තහනම් කර තිබුණා. අවසානයේදී සැම කෙනෙක්ම මෙය නිවැරදිවම දැන ගන්නවා. ඔබ මෙසේ දියුණුවෙමින් ඉදිරියටම යන විට විශාල බලයකින් යුතුව දර්ශන දැකීමට ලැබෙයි. දිගින් දිගටම වර්ධනයක් ඇති වෙනවා. අබු හි මිනිසුන් එක දිගට පේළි ගැසී සිටිනවා. කිසිම කෙනෙකුට බාබා හමුවීමට ඉඩ ලැබෙන්නේ නැහැ. ඔවුන් කියයි අහෝ

දෙවියනි ඔබගේ දිව්‍යමය ක්‍රියා එහිදී මෙයද සිහිපත් වනවා. අවසානයේදී මහාචාර්යවරුන් හා ශාස්ත්‍රාචාර්යවරුන් ආදී සියලුම දෙනා එනවා ඔවුන්ගේ සිහසුන් සෙලවෙන්නට පටන් ගන්නවා. දරුවන් විශාල සතුටකින් හිඳීවි. අච්චා.

ඉතාමත් සුමිහිරි, ආදරණීය, බොහෝ කාලයක් තිස්සේ නැති වී සිට මේ දැන් හමු වුණු ඔය දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කරයි. මෙවැනි සෙනෙහසක් සහ ස්මරණයක් ඔබට ලැබෙන්නේ එක් වතාවක් පමණයි. ඔබ ස්මරණයේ බොහෝ සිටියේනම්, ඔබට බොහෝ සෙනෙහස ද ලැබේ. ඔබගේ පාපයන් ද බොහෝ ගෙවී ගොස් ඔබට බොහෝ ධාරණය කර ගැනීමට ද හැකි වනවා ඇත. ඔබ දරුවන්ගේ සතුටෙහි රසදිය කඳ ඉහළින් තිබිය යුතුය. පැමිණෙන සෑම කෙනෙකුටම මඟ පෙන්වන්න. අසීමිත උරුමය අසීමිත පියාගෙන් ලබා ගත යුතුය. මෙය කුඩා දෙයක්ද? එවැනි උත්සාහයක් ගත යුතුමය! අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබගේ කතාවෙහිදී හා සබඳතාවන්හිදී රාජකීයත්වය තබාගන්න. ඔබේ මුවින් නිරන්තරයෙන් මිණිමුතු පමණක් පිට වීමට ඉඩ හරින්න. අන් අයවත් ඔබ වැනි තත්ත්වයට පත් කිරීමට සේවයෙහි යෙදෙන්න. කිසිම කෙනෙකුගේ හදවත පාරන්න එපා.
2. කෝපය පිළිබඳව බොහෝ සැලකිලිමත් වන්න. ඔබගේ මුහුණ දේවතාවුන්ගේ මෙන් නිරන්තරයෙන්ම උද්යෝගිමත්ව තිබිය යුතුයි. දැනුම හා යෝගා බලය මඟින් ඔබව දේවතාවක් බවට පත් කරවාගන්න.

**වරදානය:** ඔබ දර්ශන ලබා දෙන ස්වරූපයක් බවට පත් වී ඔබේ බලවත් කැඩපතින් සෑම කෙනෙකුටම තමන් පිළිබඳ සැබෑ දර්ශනයක් ලබා දෙත්වා.

ඔබ කැඩපතක් ඉදිරිපිටට යන විට, ඔබට ඔබ පිළිබඳ ඉතා පැහැදිලි දැක්මක් ලැබේ. කෙසේ වෙතත්, කැඩපත බලවත් නොවේ නම්, ඔබේ සැබෑ ස්වරූපය වෙනුවට, ඔබට වෙනත් ස්වරූපයක් පෙනෙනු ඇත. ඔබ කෙට්ටු විය හැකි නමුත්, ඔබ ඔබව මහත ලෙස දකිනු ඇත. එමනිසා, ඔබ සෑම කෙනෙකුටම තමන් පිළිබඳ දර්ශනයක් ලබා දිය හැකි තරම් බලවත් කැඩපතක් බවට පත්විය යුතුය, එනම්, ඔවුන් ඔබ ඉදිරියට පැමිණි විගස, ඔවුන් තම ශරීර අමතක කර ඔවුන්ගේ ජීවාත්ම අවධානයේ ස්වරූපයෙන් ස්ථාවර වේ. මෙය සැබෑ සේවයක් වන අතර, මේ හරහා ජයග්‍රහණයක් ලැබෙනු ඇත.

**පාඨය:** මෙම ඉගැන්වීම් ක්‍රියාවට නංවන අය මෙම ඥණයෙ සහ සෙනහසේ ප්‍රතිමූර්තිමත් ජීවාත්ම වේ.

***** ඕම ශාන්ති *****

අව්‍යක්ත් සංඥාව: ඔබේ ශ්‍රද්ධා විශ්වාසයෙ අත්තිවාරම ශක්තිමත් කර නිරන්තරයෙන් නිර්භීතව හා බාධක වලින් නිදහස්ව සිටින්න.

ඔබට පරමාත්ම පියා කෙරෙහි විශ්වාසයක් ඇත, එසේම ඔබේ බුද්ධියටද ඔබ කෙරෙහි විශ්වාසයක් ඇතිව සෑම කාර්යයක්ම ඉටු කරන්න, එවිට ඔබට ජයග්‍රහණය අත්විඳිය හැකි අතර ජයග්‍රහණය හැර අන් කිසිවක් නැත. ජයග්‍රහණය ඉදිරියේ, ගැටළු කිසිවක් නැත. නමුත් සියල්ල ක්‍රීඩාවක් ලෙස දැනෙනු ඇති අතර සතුටින් ක්‍රීඩාව කරනු ලැබේ. කාර්යයක් පහසු වූ විට, මෙසේ කියනු ලැබේ: මෙය දකුණු අත සඳහා ක්‍රීඩාවක්, එනම් එය පහසුය. ඉතින්, මෙය ඔබේ බුද්ධිය සඳහා ක්‍රීඩාවක් කර ගන්න . එවිට ක්‍රීඩාවේදී ඔබ බිය නොවනු ඇත.